ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** : **මානව සම්පත් දෙපාර්තමේන්තුව**

**දිනය** : 2018.11.07

නව නියෝජ්‍ය අධිපතිවරුන් පත් කිරීම

මුදල් මණ්ඩලය විසින් ගරු මුදල් අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරුන් වන එස්.ආර් ආටිගල මහතා සහ එච්.ඒ කරුණාරත්න මහතා 2018 ඔක්තෝබර් මස 31 වැනි දින සිට නියෝජ්‍ය අධිපති තනතුර සඳහා පත්කර ඇත.

එස්.ආර්.ආටිගල මහතා



ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 27 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එස්.ආර්.ආටිගල මහතා නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස පත්වීමට පෙර සහකාර අධිපති ධුරය හෙබ වූ අතර මුදල් අමාත්‍යංශය වෙත මුදා හරින ලදුව නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයෙකු ලෙස සේවය කළේය. ආටිගල මහතා 2018 ඔක්තෝබර් මස 31 වැනි දින සිට භාණ්ඩාගාරයේ හා මුදල් අමාත්‍යංශයේ ලේකම් ලෙස පත් කර ඇත.

ආටිගල මහතා එක්සත් රාජධානියේ, වොරික් විශ්ව විද්‍යාලයෙන් ප්‍රමාණාත්මක සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියද, කොළඹ විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද ලබා ඇත.

ආටිගල මහතා 2003 වසරේදී මුදල් අමාත්‍යංශය වෙත මුදා හරින ලද අතර, ඒ වන තෙක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු හොබවමින් සේවය කළේය. ඔහු මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය මූල්‍ය හා රාජ්‍ය ව්‍යාපාර යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල් ධුරය ඇතුළුව තනතුරු කිහිපයක කටයුතු කොට ඇත. එහිදී ලබා ගත් පරිචය ආටිගල මහතාට රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රවීනතාව ලඟා කර ගැනීමට උපකාරී විය.

ආටිගල මහතා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති ලෙස කටයුතු කර ඇති අතර භාණ්ඩාගාරය නියෝජනය කරමින් ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගම, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ඇතුළු ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත මණ්ඩල රාශියක අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කර ඇත. තවද, ඒ මහතා චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා සඳහා පත් කරන ලද තාක්ෂණික කමිටුවේ ප්‍රධානියා ලෙස මෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද වෙනත් ප්‍රධාන කමිටු කිහිපයකම භාණ්ඩාගාරය නියෝජනය කරමින් කටයුතු කර ඇත.

එච්.ඒ.කරුණාරත්න මහතා



එච්.ඒ කරුණාරත්න මහතා මහ බැංකු සේවයෙහි වසර 32 කට අධික කාලයක් සම්පූර්ණ කර ඇති අතර, ආර්ථික හා මිල ස්ථායීතාව, මූල්‍ය පද්ධති ස්ථායීතාව සහ මහ බැංකුව විසින් ඉටු කරනු ලබන අනෙකුත් නියෝජිත කාර්යයන් පිළිබඳව විශේෂ පළපුරුද්දක් ඇති නිලධාරියෙකි. කරුණාරත්න මහතා නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස පත්වීමට පෙර සේවක අර්ථසාධක අරමුදල්, අවදානම් කළමනාකරණ සහ ලේකම් දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරයා ලෙස කටයුතු කළ අතර මූල්‍ය බුද්ධි ඒකකයේ පරිපාලන කටයුතු ද අධීක්ෂණය කළේය. මීට අමතරව කරුණාරත්න මහතා පසුගිය වසර හතරකට ආසන්න කාලයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කළ අතර  මුදල් මණ්ඩල උපදේශක විගණන කමිටුවේ,  මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද අවදානම් පිරික්සුම් කමිටුවේ හා ආචාර ධර්ම කමිටුවේ ලේකම් ලෙසත් ශ්‍රී ලංකා මහ බැංකුවේ දුෂ්කෘත නිවේදන ප්‍රතිපත්ති ලේකම් කාර්යාලයේ ප්‍රධානියා ලෙසත් කටයුතු කළේය.

කරුණාරත්න මහතා ඇමරිකා එක්සත් ජනපදයේ ඔහායෝ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

කරුණාරත්න මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ වත්මන් උප සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර එම ආයතනයේ විගණන කමිටුවේ සභාපතිවරයා ද වේ. සංචිත කළමනාකරණය, ණය කළමනාකරණය, සුරැකුම්පත් වෙළෙඳපොළ, අවදානම් කළමනාකරණය සහ මූල්‍ය බුද්ධි ආදී වූ ක්ෂේත්‍ර පිළිබඳ ඇති පෘථුල දැනුම හා දෙස් විදෙස් අත්දැකීම් හරහා කරුණාරත්න මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විශාල දායකත්වයක් සපයා ඇත. ඔහු සංචිත කළමනාකරණය, රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ, ව්‍යුත්පන්න වෙළෙඳපොළ සහ ප්‍රාථමික ගණුදෙනුකාර පද්ධති වැනි මාතෘකා යටතේ පර්යේෂණ ලිපි කිහිපයක්ම පළ කොට ඇත.